**ශීර්ෂය 197 - නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2016 වර්ෂය**

---

ශීර්ෂය 197 - නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 11,100.10 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 7,939.03 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 3,161.07 ක් හෙවත් සියයට 28.48 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| --- | --- | --- | --- | --- |
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 3,678.25 | 3,412.71 | 265.54 | 7.22 |
| මූලධන | 7,421.85 | 4,526.32 | 2,895.53 | 39.01 |
| **එකතුව** | **11,100.10** | **7,939.03** | **3,161.07** | **28.48** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 19701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
| --- | --- | --- | --- | --- | --- |
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 25.00 | 18.14 | 9.00 | 9.79 | 90.00 | 45.08 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 27.76 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0126/000 | 0.12 |
| 6000/0000/00/0016/0116/000 | 27.65 |
| **එකතුව** | **27.76** |

## 2.4 විගණන නිරීක්ෂණය

නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 05ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 76.44 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ) අමාත්‍යාංශයට අදාළ කාර්යභාරයන් ඉටු කිරිම සඳහා වැය විෂයයන් 10 ක් යටතේ සලසා තිබුණු එකතුව රු.මිලියන 329.52 ක ප්‍රතිපදනවලින් එම කාර්යභාරය අපෙක්ෂිත පරිදි ඉටු නොකිරීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 70 ක සිට සියයට 95 ක් දක්වා පරාසයක පුමාණයක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 94(1) හි සඳහන් විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 14 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.මිලියන 3.61 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

### 3.2 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.මිලියන 25.53 ක්වූ තැන්පතු 43 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 19701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවීමට තිබුණු ශේෂවල එකතුව රු. 415,750 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 05 ක කාලයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය යටතේ ආයතන 11 ක් ක්‍රියාත්මකව පැවති අතර අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණක හැරුණු විට විගණන කාර්යයන් සඳහා නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. මේ හේතුවෙන් එකී ආයතනයන්හි අඛණ්ඩව පුළුල් විගණනයක් සිදු කිරීමට නොහැකි වි තිබුණි. සමාලෝචිත වර්ෂයේදී විශේෂ විමර්ශන 05 ක් සිදු කර තිබුණු අතර අභ්‍යන්තර විගණන වාර්තාවක් පමණක් නිකුත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ අභ්‍යන්තර විගණන සැලැස්මෙන් අපේක්ෂා කර තිබූ විගණන කාර්යභාරයන් අපේක්ෂිත මට්ටමින් ඉටුකර නොතිබුණු අතර අභ්‍යන්තර විගණනය කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

2015 වර්ෂයේදී ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ වෙත මුදාහැර තිබුණු රු.මිලියන 41.93 ක් වටිනා වාහන 07 ක ලියාපදිංචිය තවදුරටත් අමාත්‍යාංශය නමින් පැවති අතර ඒවා විධිමත්ව පවරා දීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**(ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) 2016 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පැවති වාහන 38 ක් අතරින් ආමාත්‍යාංශයට අයත්ව නොතිබුණු වාහන 04 ක් අමාත්‍යාංශය වෙත විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව 1999 වර්ෂයේ සිට අමාත්‍යාංශයේ කටයුතු සඳහා භාවිතයට යොදාගෙන තිබුණි.

(ii) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව ගරු අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යාලවල සේවයේ නියුක්ත කරවිය හැකි කාර්ය මණ්ඩලය ඉක්මවා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 03 කට අයත් නිලධාරීන් 08 දෙනෙකු අමාත්‍ය කාර්යාලයේ හා රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ සේවයේ යොදවා තිබුණි. එම ආයතනවලින් එම නිලධාරීන් වෙත වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු.මිලියන 2.71 ක් වැය කර තිබුණි.

## 3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 2009 අගෝස්තු 05 දිනැති අංක 10/2007(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධික 2007 මැයි 09 දිනැති අංක 10/2007 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වෙත චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව නිල නිවසේ ජල හා විදුලිය බිල්පත් වෙනුවෙන් පමණක් එම චක්‍ර ලේඛයේ සඳහන් සීමාව ඉක්මවා එකතුව රු.1,308,937 ක් වැය කර තිබුණි. |
| **(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ** | |
| 2013 ඔක්තෝබර් 24 දිනැති අංක 2013/2014(ii) දරන ටීජ් චක්‍රලේඛය | 2016 වර්ෂයේ අමාත්‍යාංශයේ නිලධාරීන් 11 දෙනෙකු විදේශ පුහුණු වැඩසටහන්වලට සහභාගී තිබුණත්, එම නිලධාරීන් විසින් විදේශ පුහුණුවට අදාළ වාර්තා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඉදිරිපත් කළ බව සනාථ කරන තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ** | |
| 2015 ජුලි 23 දිනැති අංක 7/2015 දරන චක්‍ර ලේඛයේ 8 ඡේදය | අමාත්‍ය හා රාජ්‍ය අමාත්‍ය කාර්යාලවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට අදාළ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල සඳහා වන රජයේ දායකය චක්‍රලේඛයේ සඳහන් කාලවකවානු ප්‍රමාද කර අදාළ ආයතන වෙත ප්‍රේෂණය කර තිබුණි. |

## 3.7 කාර්යසාධනය

ගුණාත්මකභාවයෙන් පිරි වෘත්තීය පුහුණුවක් ලබාදීම තුළින් ලෝකයට අවශ්‍ය මානව සම්පත සංවර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 07 කට අනුබද්ධව දිවයින පුරා මධ්‍යස්ථාන 397 ක් ක්‍රියාත්මකව පැවතුණි. එකී ආයතනයන්හි කාර්යසාධනය සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **වාර්ෂිකව පාසල් පද්ධතිය තුළින් විශ්වවිද්‍යාල ප්‍රවේශය නොලබන තරුණ ප්‍රජාවට සාපේක්ෂව වෘත්තීය පුහුණු අවස්ථා සඳහා පහසුකම් සම්පාදනය කර නොතිබීම**

---

2015 වර්ෂය වනවිට අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) අසමත්ව උසස් අධ්‍යාපනය අහිමි වූ සිසුන් 210,695 දෙනෙකු පමණ විය. 2016 වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල විද්‍යායතන ඇතුළු ආයතන 08 කින් විගණනයට ලබාදුන් තොරතුරු අනුව වෘත්තීය පුහුණුව සඳහා සිසුන් 97,925 දෙනෙකු ඇතුළත් කර ගෙන තිබුණි. මේ අනුව උසස් අධ්‍යාපන අවස්ථා අහිමිවන සිසුන්ට සාපේක්ෂව වෘත්තීය පුහුණු අවස්ථා සම්පාදනය වී නොතිබුණි. මේ නිසා උසස් තාක්ෂණ ආයතන, කාර්මික විද්‍යාල හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මගින් පවත්වාගෙන යන පාඨමාලා සඳහා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණාත්මකව ඉහළ නැංවීමට අමාත්‍යාංශයේ අවධානය යොමු විය යුතුව තිබුණත් ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ආ) **පුහුණු වැඩසටහන්වල ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීමට කටයුතු නොකිරීම**

---

1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් සහිත (NVQ) පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීම සිදුකළ යුතු වුවද, අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන පවත්වනු ලබන පාඨමාලා 2148 ක් අතරින් පාඨමාලා 526 ක් සම්බන්ධයෙන් පනතෙහි විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. එසේම විද්‍යාගාර පහසුකම් ප්‍රමාණාත්මක නොවීම හා විද්‍යාගාර භාවිතා කළ හැකිවන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කර නොතිබීම පුහුණු පාඨමාලාවන්හි ගුණාත්මක තත්ත්වය අඩුවීම කෙරෙහි බලපා තිබුණි. ඒ අනුව නිසි ප්‍රමිතියකින් දේශීය හා විදේශීය පිළිගැනීම සහිත ගුණාත්මක පාඨමාලා තුළින් ගෝලීයව සවිබල ගැන්වුණු රැකියාගත කළ හැකි ශ්‍රම බලකායක් බිහිකිරීමේ අමාත්‍යාශයේ අරමුණ ඉටු කර නොතිබුණි.

(ඇ) **පුහුණු පාඨමාලා සඳහා සිසු සහභාගීත්වයේ ප්‍රමාණාත්මකභාවය අඩුවීම**

---

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) පුහුණු පාඨමාලා සඳහා සිසු සහභාගීත්වයේ ප්‍රමාණාත්මකභාවය වර්ධනය වී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළව විගණනයට ලැබුණු තොරතුරුවලට අනුව අමාත්‍යාංශයට අයත් විශ්වවිද්‍යාල විද්‍යායතන ඇතුළු ආයතන 09 ක සියයට 70 කට අඩු සිසුන් සංඛ්‍යාවක් බඳවා ගෙන තිබුණු පාඨමාලා සංඛ්‍යාව 306 ක් වී තිබුණි.

(ii) එසේම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 05ක වෘත්තීය පුහුණුවීම් සඳහා අවශ්‍ය පහසුකම් හා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම සහිත පාඨමාලා 375 ක් සඳහා බඳවා ගෙන තිබුණු සිසුන්ගේ සහභාගීත්වය අවම මට්ටමක පැවතුණි. ඒ අනුව සිසුන් 5 දෙනෙකු හා 10 දෙනෙකු අතර සංඛ්‍යාවක් බඳවා ගෙන තිබුණු පාඨමාලා 204 ක්ද, සිසුන් 5 කට අඩු සිසුන් සංඛ්‍යාවක් බඳවාගත් පාඨමාලා 40 ක් ද පැවති අතර පාඨමාලා 131 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යයින් බඳවාගෙන නොතිබුණි. එමෙන්ම තරුණ ප්‍රජාවේ ආකර්ශනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම, සමාලෝචිත වර්ෂයේදී පුහුණු ආයතන සතු සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට නොහැකි වීම කෙරෙහි බලපා තිබුණු ප්‍රධාන සාධකයක් විය.

එක් එක් ආයතනයන්හි පාඨමාලා පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් මගින් පාසල් සිසුන් හා පාසල් හැරගිය සිසුන් අඛණ්ඩ දැනුවත් කිරීම තුළින් පාඨමාලා සඳහා යොමුකරවා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, මේ සම්බන්ධයෙන් වූ අමාත්‍යාංශ දායකත්වය අවම මට්ටමක පැවතීම නිසා පාඨමාලාවලින් අපේක්ෂිත ප්‍රමාණාත්මක ප්‍රතිඵලය ලඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) **පුහුණු මධ්‍යස්ථාන මධ්‍යගතව පිහිටා තිබීම**

---------------------------------------------

අමාත්‍යාංශය යටතේ ඇති විවිධ ආයතනවල සමාන පාඨමාලා පවත්වන පුහුණු මධ්‍යස්ථාන කේන්ද්‍රගතව පිහිටා තිබීම හේතුවෙන් සිසුන්ට පාඨමාලා තෝරාගැනීමේ ගැටළු ඇතිවීමේ ඉඩකඩ පැවැති අතර පාඨමාලා සඳහා සිසුන් සංඛ්‍යාව අඩු වීමට ද එයට හේතුවී තිබුණි. ආර්ථික සමාජීය දුෂ්කරතා සහිත සිසුන්ට අවස්ථාවක් ලබාදීම සඳහා පුහුණු මධ්‍යස්ථාන ප්‍රාදේශීයව පැවතීමේ අවශ්‍යතාවය පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු කර නොතිබුණි.

(ඉ) **2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------

2016 අයවැය යෝජනා යටතේ **වෘත්තීය හා කාර්මික අධ්‍යාපනය ශක්තිමත් කිරීම** වෙනුවෙන් රු.මිලියන 800 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 371.6 ක් වැය කර තිබුණු අතර ඊට අදාළ මූල්‍ය ප්‍රගතිය සියයට 53 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **සාගර විශ්වවිද්‍යාලයේ නව උපාධි පාඨමාලා ආරම්භ කිරීම**

-----------------------------------------------------------

සාගර විශ්වවිද්‍යාලයෙහි Marine Biology, Marine Recreation and Sea Port, Boat/Ship Building, Integrated Coastal Resource Management යන ක්ෂේත්‍රයන්හි නව උපාධි පාඨමාලා ඇරඹීමට 2016 වාර්ෂික අයවැය මගින් යෝජනා කර තිබුණු අතර ඊට අදාළව රු. මිලියන 300 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජිතව තිබුණද, ඒ සඳහා වූ උපදේශක ගාස්තු හා පස් පරීක්ෂාව වෙනුවෙන් පමණක් එකතුව රු. මිලියන 6.49 ක් වැය කර තිබුණි.

(ii) **ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ සිසුන් ප්‍රමාණය 200 කින් ඉහළ නැංවීම**

---------------------------------------------------------------------------------

සිසුන් ප්‍රමාණය වැඩිකිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 500 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර, පන්ති කාමර හා විද්‍යාගාර ඉඩ පහසුකම් වැඩිකිරීම සඳහා සලසා තිබුණු රු. මිලියන 29 කින් රු. මිලියන 20.61 ක් පමණක් වැය කර තිබුණි. නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 108 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එම කාර්ය ඉටු නොකිරීම නිසා මුළු ප්රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ඊ) **යොවුන් දිරිය වැඩසටහන**

---------------------------

වෘත්තීය පුහුණු කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද යොවුන් දිරිය වැඩසටහන සඳහා රු.මිලියන 30 ක ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **ලෝක තරුණ නිපුණතා දිනය**

-----------------------------------

ලෝක තරුණ නිපුණතා දිනය වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු. මිලියන 10 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, එම ප්‍රතිපාදනවලින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු හඳුනාගෙන ඒ සඳහා වූ සැලැසුම් පිළියෙල කර නොතිබුණි. ඒ අනුව 2016 ලෝක තරුණ නිපුණතා දිනය සඳහා සැමරුම් උත්සවයක් සංවිධානය කිරීම හැර වෙනත් කාර්යයක් ඉටු කර නොතිබුණු අතර ඒ වෙනුවෙන් රු. 244,734 ක් හා පුවත් පත් දැන්වීම් පළ කිරීම වෙනුවෙන් රු.903,527 ක් පමණක් යොවුන් දිරිය වැඩසටහන යටතේ වියදම් කර තිබුණි.

(ii) **රාජ්‍ය හා පෞද්ගලික අංශය හවුල්කාරීත්වය ( Public Private Partnership)**

------------------------------------------------------------------------------------

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවලින් විදුලි කාර්මික විෂය පිළිබඳ න්‍යායාත්මක පුහුණුවීම් ලබන අභ්‍යාසලාභීන් ලංකා විදුලිබල මණ්ඩලයේ ආධුනිකත්ව පුහුණුව සඳහා යොමු කිරීමේ අරමුණින් 2012 අගෝස්තු 23 දින තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි.

දිවයින පුරා විහිදී පවතින කාර්මික විද්‍යාල 30 ක වාර්ෂිකව ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමෙහි දෑ අවුරුදු විදුලි කාර්මික පාඨමාලාවන් පවත්වාගෙන යන අතර කාර්මික විද්‍යාල 19 කින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සිසුන් 448 දෙනෙකු උක්ත පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි. එම සිසුන් විදුලිබල මණ්ඩලයේ ආධුනිකත්ව පුහුණුවට අනුයුක්ත කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද, විදුලිබල මණ්ඩලය විසින් එවන ලද නාමලේඛණයකට අනුව කාර්මික විද්‍යාල 18 ක් සඳහා සිසුන් 512 ක් 2012 සැප්තැම්බර් මාසයේ සිට අනුයුක්ත කර එම සිසුන් සඳහා වෙනම එක් අවුරුදු විශේෂ විදුලි කාර්මික පාඨමාලාවක් පවත්වා තිබුණි. එම සිසුන්ගේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් රු.8,168,195 ක් අමාත්‍යාංශය විසින් වැය කර තිබුණි. ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමෙහි වර්ෂයක අධ්‍යයන කාලපරිච්ඡේදයක් වූ මෙම විශේෂ විදුලි කාර්මික පාඨමාලාවට සාමාන්‍ය විදුලි කාර්මික පාඨමාලාවට අන්තර්ගත වන විෂය කරුණු ඇතුළත් වන බව අනාවරණය විය. මේ සම්බන්ධයෙන් එකම විෂය කරුණු ඉගැන්වීම සඳහා පාඨමාලා දෙකක් පවත්වාගෙන යාමට හේතු වූ කරුණු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(iii) **පුහුණු කිරීම් හා ප්‍රදර්ශන පැවැත්වීම**

--------------------------------------

සමාලෝචිත වර්ෂයේදී පුහුණු කිරීම් හා ප්‍රදර්ශන පැවැත්වීම වෙනුවෙන් යොවුන් දිරිය වැඩසටහන යටතේ රු. මිලියන 15 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, නිලධාරීන් 175 දෙනෙකු සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ පස් දින නේවාසික වැඩමුළු 07 ක් සහ සහකාර සංවර්ධන නිලධාරීන් 75 දෙනෙකු සඳහා දෙදින වැඩ මුළුවක් පමණක් පවත්වා තිබුණි. ඒ අනුව වර්ෂය තුළ රු.මිලියන 3.39 ක් වැය කර තිබුණු අතර එය අයවැය ප්‍රතිපාදනය සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රගතිය සියයට 22.6 ක් වී තිබුණි. එසේම උක්ත වැඩසටහන යටතේ පැවැත්වීමට සැලැසුම් කර තිබූ " Touch Your Future" ප්‍රදර්ශනය සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) යොවුන් දිරිය වැඩසටහන සඳහා වූ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් සලසා තිබුණු ප්‍රතිපාදනය ඵලදායී ලෙස උපයෝජනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු බව පසුගිය වර්ෂ කිහිපය තුළ සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය කිරීම විග්‍රහ කිරීමේදී අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | වාර්ෂික අයවැය ප්‍රතිපාදනය | උපයෝජනය | උපයෝජනය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | 100.00 | 17.74 | 17.7 |
| 2014 | 104.00 | 71.96 | 69.2 |
| 2015 | 80.00 | 14.96 | 18.7 |
| 2016 | 30.00 | 6.27 | 20.9 |

(උ) **විශ්වවිද්‍යාල විද්‍යායතනවල ක්‍රියාකාරීත්වය**

විශ්වවිද්‍යාල වරම් අභිමිවන තාක්ෂණ විෂය හැදෑරූ සිසුන් වෙනුවෙන් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ ජාතික වෘත්තීය සුදුසුකම 5 හා 6 සහිත පාඨමාලා පවත්වමින් මධ්‍යම මට්ටමේ තාක්ෂණිකයන් බිහිකිරීමේ අරමුණින් විශ්වවිද්‍යාල විද්‍යායතන 20 ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණද, 2016 වර්ෂය වනවිට රත්මලාන, කුලියාපිටිය, යාපනය, මාතර, අනුරාධපුර සහ බටංගල වශයෙන් විශ්වවිද්‍යාල විද්‍යායතන 06 ක් පමණක් ආරම්භ කර තිබුණි. කෙසේවුවද පහත සඳහන් කරුණු හේතුවෙන් ඒවායේ ක්‍රියාකාරීත්වය ද නිසි පරිදි සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) විශ්වවිද්‍යාල විද්‍යායතනවල අධ්‍යක්ෂවරුන් සේවයෙන් ඉල්ලා අස්වීම, සේවය අතහැර යාම සහ වරින්වර විද්‍යායතන අතර තාවකාලික ස්ථාන මාරුවීම් ලබා දී තිබීම හේතුවෙන් විද්‍යායතනයන්හි පරිපාලන කටයුතු, ශිෂ්‍ය සහ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි විනය පවත්වාගෙන යාම කෙරෙහි බලපෑම් ඇති වී තිබුණි.

(ii) විද්‍යායතනයන්හි පරිපාලන කටයුතු හා මූල්‍ය කළමනාකරණ කටයුතු රජයේ පරිපාලන විධිවිධාන, චක්‍රලේඛයන්ට හා මූල්‍ය පරිපාටින්ට අනුකූලව සිදු කිරීම සඳහා විධිමත් මඟපෙන්වීමක් හා අධීක්ෂණයක් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය හෝ අමාත්‍යාංශය මට්ටමින් සිදු කර නොතිබුණි.

(iii) විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ වෘත්තීයමභාවය හා වෘත්තීය පරිචයන් ආරක්ෂා කිරීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි.

(iv) විද්‍යායතනයන්හි පවත්වාගෙන යනු ලබන ඩිප්ලෝමා පාඨමාලා සඳහා තෘතීයික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීම හා ප්‍රතීතනය කිරීම කළ යුතු වුවද, කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පවත්වනු ලබන පාඨමාලා 8 ක් හැර අනෙකුත් විද්‍යායතනවල පාඨමාලා ප්‍රතීතනය කර නොතිබුණි.

(v) විද්‍යායතනවල කටයුතු අභ්‍යන්තර විගණනයකට භාජනය කර නොතිබුණි.

(vi) විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි පාඨමාලා 49 ක් සඳහා මුළු ශිෂ්‍ය ධාරිතාවය 1,470ක් වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ සිසුන් 1,380 ක් පමණක් ලියාපදිංචි කර තිබුණු අතර ඉන් සිසුන් 245 දෙනෙකු පාඨමාලා හැරදමා ගොස් තිබුණි.

(vii) කථිකාචාර්ය තනතුරු 51 ක්, ප්‍රදර්ශක තනතුරු 22 ක් හා එක් උපදේශක තනතුරක් වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතුණි.

(viii) පුහුණු උපකරණ භාවිතය සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම්, යටිතල පහසුකම් නොතිබුණි.

**3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය ආරම්භ කිරීමට පෙර අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2015 ජනවාරි මාසය හා ජූලි මාසවලදී පිළිවෙලින් නිලධාරීන් 4 දෙනෙකු හා නිලධාරීන් 14 දෙනෙකු වශයෙන් බඳවා ගැනීම් සිදුකර වැටුප්, දීමනා හා අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙන් එකුතව රු.10,282,015 ක වියදමක් ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘති අරමුදලින් කර තිබුණි.

**3.9 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය සතු අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින හා භාවිතයෙන් තොරව පැවති වාහන 03 ක් සම්බන්ධයෙන් 2015 මාර්තු 31 දිනැති අංක 2/2015 දරන ජාතික අයවැය චක්‍ර ලේඛයේ 7 ඡෙදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේදී අමාත්‍යාංශය සතු වාහනයක් අළුත්වැඩියා කිරීම සඳහා පෞද්ගලික ආයතනයක වෙත ලබා දී තිබුණත්, එම වාහනය අළුත්වැඩියා කර අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙන්වා ගෙන නොතිබුණි.

**3.10 මානව සම්පත් කළමණාකරනය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 21 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 437 | 374 | 63 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 49 | 39 | 10 |
| | **එකතුව** | **516** | **435** | **81** |